ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 නොවැම්බර් මස 14 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: 2018 - අංක 07

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2018 නොවැම්බර් මස 13 වැනි දින පැවති රැස්වීමේ දී වාණිජ බැංකු වෙතැති සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) පහත හෙළීමට තීරණය කළේය. මෙම තීරණයෙහි බලපෑම සමනය කිරීම සඳහා සහ සිය මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) පදනම් අංක 75 කින් සියයට 8.00 දක්වාද නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 50 කින් සියයට 9.00 දක්වාද ඉහළ නැංවීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

මැදිකාලීනව උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ ස්ථායී ලෙස පවත්වා ගැනීම මගින් ආර්ථිකයට සිය උපරිම වර්ධන මට්ටමට ළඟා වීම සඳහා

**සහාය වීමේ පුළුල් අරමුණ ඇතිව, දැනට පවත්නා සහ අපේක්ෂිත දේශීය හා විදේශීය ආර්ථික වර්ධනයන් මෙන්ම, දේශීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වද පරීක්ෂාකාරී ලෙස සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය ඉහත තීරණයට එළඹියේය.**

## දේශීය වෙළඳපොළ තුළ දැඩි මුදල් තත්ත්වයක් අඛණ්ඩව පැවතිණි

දේශීය මුදල් වෙළඳපොළෙහි ඉහළ මට්ටමක සහ අඛණ්ඩව පැවති ද්‍රවශීලතා හිඟය හේතුවෙන් එක්දින වෙන්දේසිවලට අමතරව කෙටි කාලීන හා දිගු කාලීන පදනම මත විවට වෙළඳපොළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය. දැනට පවත්නා ද්‍රවශීලතා තත්ත්වය පිළිබිඹු කරමින් එක්දින පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයේ පැවතීමට ඉඩ සලසන ලදී. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ ඵලදා අනුපාතික මෑත සතිවලදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, අනෙකුත් බොහෝ වෙළඳපොළ පොලී අනුපාතික නාමික මෙන්ම මූර්ත වශයෙන් ඉහළ මට්ටම්වල පැවතිණි.

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය 2018 සැප්තැම්බර් මාසයේ දී අඛණ්ඩව මන්දගාමී විය. කෙසේ වුවද, අධික ආනයන වියදම් සීමා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ඇතැයි යන අපේක්ෂා ඇතිව, ව්‍යාපාර විසින් ණය ගැනීම් වැඩි වශයෙන් සිදු කිරීම හේතුවෙන් වාණිජ බැංකු වෙතින් පෞද්ගලික අංශය ලබා ගත් ණය ප්‍රමාණය ඉහළ ගිය අතර, එය ඇතැම් විට කෙටි කාලීන තත්ත්වයක් විය හැකිය. 2018 වසරේ තෙවන කාර්තුව තෙක් වන දත්තවලට අනුව, ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශ වෙත සපයන ලද ණය වර්ධනය වූ අතර, පෞද්ගලික ණය සහ අත්තිකාරම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය යළිත් මන්දගාමී වී අපේක්ෂිත මට්ටමට ළඟාවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## උද්ධමනය අඩු තනි අගයක් දක්වා අඩු විය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) මත පදනම් වූ මතුපිට උද්ධමනය, ප්‍රධාන වශයෙන් නිතර මිල උච්චාවචනය වන ආහාර මිල ගණන් අඩු වීම හේතුවෙන් අපේක්ෂිත මැදි තනි අගයක මට්ටමට වඩා අඩු විය. පෙර වසරවලදී පවත්වා ගෙන යනු ලැබූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි බලපෑම හේතුවෙන් මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා පිළිබිඹු කරමින් මූලික උද්ධමනය ද අඛණ්ඩව පහළ මට්ටමක පැවතිණි. මෙම වර්ධනයන් සමඟ මෙම වසරේ ඉතිරි කාලසීමාව තුළ මතුපිට උද්ධමනය පහළ තනි අගයක මට්ටමේ පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, සුදුසු ප්‍රතිපත්ති ගැළපීම් සමඟ උද්ධමනය 2019 වසර තුළදී සහ ඉන්පසු කාල සීමාව තුළ ඉලක්කගත සියයට 4-6 පරාසයෙහි පවත්වා ගෙන යැමට අපේක්ෂා කෙරේ.

## විදේශීය අංශයෙහි ක්‍රියාකාරිත්වය සඳහා විදේශීය සහ දේශීය අංශවල ප්‍රවණතා බලපා ඇත

අපනයන ඉපැයීම්වල වර්ධනය අබිබවා ආනයන වියදම අඛණ්ඩව ඉහළ යැම හේතුවෙන් 2018 වසරේ පළමු මාස නවය තුළදී වෙළඳ හිඟය පෙර වසරේ ඊට අදාළ කාල පරිච්ඡේදයට සාපේක්ෂව තවදුරටත් පුළුල් විය. කෙසේ වෙතත්, මෑතදී ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙන්ම, ප්‍රධාන විදේශ විනිමයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමට ප්‍රතිචාර දක්වමින් ඉදිරි කාලයේදී ආනයන වියදමේ මන්දගාමී වීමක් අපේක්ෂා කෙරේ. විදේශ ජංගම ගිණුමේ ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගත් කල, සංචාරක කටයුතු ආශ්‍රිත ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් මන්දගාමී වීමක් දැකිය හැකි විය. මූල්‍ය ගිණුම තුළ, විශේෂයෙන්ම ජාත්‍යන්තර පොලී අනුපාතික ඉහළ යැම සහ දේශපාලන අවිනිශ්චිතතාව හේතුකොටගෙන රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ තුළින් විදේශ ආයෝජන ඉවතට ඇදී යැමක් දක්නට ලැබිණ.

ඉහළ ආනයන වර්ධනය මෙන්ම, එ.ජ. ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් මෑතකාලීනව සිදු වූ ප්‍රාග්ධන පිටතට ගලායෑම්, විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කළේය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ වේගය මෑතදී මන්දගාමී වුවද, 2018 වසරේ නොවැම්බර් 13 දක්වා කාලය තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 12.9 කින් අවප්‍රමාණය විය. මේ අතර, රජය ලද එ.ජ. ඩොලර් බිලියනයක දිගුකාලීන විදේශ විනිමය මූල්‍ය පහසුකම හේතුවෙන් 2018 ඔක්තෝබර් මස අවසානය වන විට දළ නිල විදේශ සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.9 ක් වූ අතර, එය මාස 4.2 ක ආනයන ආවරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් වේ.

## 2018 වසරේදී ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නවතම ආර්ථික දර්ශකවලට අනුව, මූර්ත ද.දේ.නි වර්ධනය 2018 වසරේදී බොහෝ විට අපේක්ෂිත මට්ටමට වඩා අඩු වනු ඇත. ආර්ථිකයේ අධිඉල්ලුමක් සහ ඉහළ උද්ධමනයකට හේතුවන තිරසාර නොවන කෙටිකාලීන මුදල් සහ රාජ්‍ය මූල්‍ය සානුබල මත රඳා පවතිනු වෙනුවට, ආර්ථික වර්ධනය තිරසාර පදනමකින් ඉහළ නැංවීම සඳහා ආර්ථික වර්ධනයට හේතුවන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පුළුල් සහ විනිවිදභාවයකින් යුතු වැඩපිළිවෙළක් යටතේ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

## මුදල් ප්‍රතිපත්ති තීරණය වෙළඳපොළ වෙත මධ්‍යස්ථ බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂිතය

උද්ධමනයෙහි සහ ආර්ථික වර්ධනයෙහි දැනට පවතින සහ අපේක්ෂිත වර්ධනයන් මෙන්ම, දේශීය මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් දැනට පවතින මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගැනීම යෝග්‍ය බව 2018 නොවැම්බර් මස 13 වැනි දින පැවති රැස්වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස විය. කෙසේ නමුත්, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති ඉහළ සහ අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය හමුවේ ප්‍රතිපත්තිමය මැදිහත්වීමක අවශ්‍යතාව පිළිබඳ මුදල් මණ්ඩලයේ අවධානය යොමු වූ

අතර, ඒ අනුව වාණිජ බැංකු වෙතැති සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) දැනට පවතින සියයට 7.50 මට්ටමේ සිට 2018 නොවැම්බර් 16 වන දින පටන් ආරම්භ වන මීළඟ සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට 6.00 දක්වා ප්‍රතිශතාංක 1.50 කින් පහත හෙළීමට මුදල් මණ්ඩලය තීරණය කළේය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම මගින් සැලකිය යුතු තරම් රුපියල් ද්‍රවශීලතාව බැංකු පද්ධතිය වෙත මුදා හැරීමට සහ එමගින් බැංකුවල අරමුදල් පිරිවැය අඩුවනු ඇතැයි අපේක්ෂිතය. එමෙන්ම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහත හෙළීමේ බලපෑම සමනය කිරීම සහ මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමට මුදල් මණ්ඩලය තීරණය කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) පදනම් අංක 75 කින් සියයට 8.00 දක්වා ද සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 50 කින් සියයට 9.00 දක්වා ද ඉහළ නංවමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පරතරය පදනම් අංක 100 දක්වා අඩු කිරීමට කටයුතු කරන ලදී. මෙම ප්‍රතිපත්ති වෙනස්කිරීම් මගින් වෙළඳපොළ තුළ තැන්පතු සහ ණය පොලී අනුපාතික අතර පවතින පරතරය අඩු වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කරන ලද අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නංවන ලදී.** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 8.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 9.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 6.00 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගේ ප්‍රධානත්වයෙන් අද දින (2018 නොවැම්බර් 14) ප.ව. 1.30 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මාධ්‍ය හමුවක් පැවැත්වේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2018 දෙසැම්බර් මස 28 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

## දත්ත ඇමුණුම:

### සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | මාර්-18 | ජුනි-18 | ජුලි-18 | අගෝ-18 | සැප්-18 | ඔක්-18 |
|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 4.2 | 4.4 | 5.4 | 5.9 | 4.3 | 3.1 |
| | ජා.පා.මි.ද. (2013=100) | 2.8 | 2.5 | 3.4 | 2.5 | 0.9 | - |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 3.4 | 3.4 | 3.9 | 3.7 | 3.8 | 3.8 |
| | ජා.පා.මි.ද. (2013=100) | 1.9 | 1.8 | 2.3 | 2.7 | 3.1 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මාර්-18 | ජුනි-18 | අගෝ-18 | සැප්-18 | මාර්-18 | ජුනි-18 | අගෝ-18 | සැප්-18 |
| සංචිත මුදල් | 997 | 999 | 1,005 | 1,011 | 11.8 | 12.0 | 10.2 | 11.2 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 6,607 | 6,748 | 6,866 | 6,933 | 16.4 | 14.9 | 13.5 | 13.1 |
| ශුද්ධ විදේශීය වත්කම් | 106 | 101 | 167 | 8 | 128.6 | 141.1 | 433.1 | (27.0) |
| ශුද්ධ දේශීය වත්කම් | 6,500 | 6,646 | 6,700 | 6,926 | 7.5 | 8.6 | 9.8 | 13.1 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 2,278 | 2,273 | 2,272 | 2,427 | 2.9 | 1.7 | 1.5 | 9.2 |
| රාජ්‍ය සංස්ථා සඳහා ලබා දුන් ණය | 557 | 619 | 639 | 656 | (2.6) | 8.5 | 22.6 | 27.1 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 5,022 | 5,156 | 5,248 | 5,356 | 15.3 | 14.9 | 14.3 | 15.4 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 8,112 | 8,292 | 8,403 | 8,502 | 16.7 | 14.8 | 12.7 | 12.5 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

# සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| **පොලී අනුපාතික (%)** | **2018 මාර්. අවසානයට** | **2018 ජුනි අවසානයට** | **2018 අගෝ. අවසානයට** | **2018 සැප්. අවසානයට** | **2018 ඔක්. අවසානයට** | **2018 නොවැ. 13 දිනට** |
|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25* |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.75 | 8.50 | 8.50 | 8.50 | 8.50 | 8.50** |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.41 | 8.50 | 7.92 | 8.40 | 8.44 | 8.49 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | |
| දින 91 | 8.17 | 8.32 | 8.03 | 8.56 | 9.48 | 9.65 |
| දින 182 | - | 8.85 | 8.60 | - | 9.75 | 9.99 |
| දින 364 | 9.69 | 9.39 | 8.99 | 9.51 | 10.39 | 10.89 |
| **ණය අනුපාතික** | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.55 | 11.33 | 11.67 | 11.74 | 12.25 | 11.95 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 14.04 | 14.05 | 14.18 | 14.27 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.25 | 13.94 | 14.35 | 14.22 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 9.00 | 8.92 | 8.66 | 8.69 | 8.73 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 11.41 | 11.26 | 10.81 | 10.84 | 10.78 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 10.33 | 10.57 | 10.24 | 9.72 | - | - |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

* 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 8.00 දක්වා ඉහළ නංවන ලදී.

** 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 9.00 දක්වා ඉහළ නංවන ලදී.